


# හොඳම පාසල් ව්‍යවසායකත්ව සමාජය තේරීමේ ජාතික තරඟාවලිය 2023

## උපදෙස් සංග්‍රහය

**අධ්‍යාපන අමාත්‍යාංශයේ පූර්ණ අධීක්ෂණය යටතේ**
**ශ්‍රී ලංකා අලෙවිකරණ ආයතනය (SLIM)**
**විසින් සංවිධානය කරනු ලබන ව්‍යාපෘතියකි**

# <u>හොඳම පාසල් ව්‍යවසායකත්ව සමාජය තේරීමේ</u>

# <u>ජාතික තරඟාවලිය - 2023</u>

අධ්‍යාපන අමාත්‍යාංශයේ වාණිජ හා ව්‍යාපාර අධ්‍යයන ශාඛාවේ උපදෙස් හා සම්බන්ධීකරණය යටතේල ශ්‍රී ලංකා අලෙවිකරණ ආයතනය (SLIM) විසින්ල දිවයිනේ පාසල්වල ව්‍යවසායකත්ව සමාජ අතුරින් **"හොඳම පාසල් ව්‍යවසායකත්ව සමාජය"** තේරීම සඳහා තරඟාවලියක් පැවැත්වීමට කටයුතු සංවිධානය කර ඇත.

## <u>තරඟාවලියේ අරමුණ</u>

**පාරිසරික තිරසාර බව හා දේශීයත්වයට** මුල්තැන දෙමින්ල රැකියා හැකියාව වැඩිදියුණු කරමින්ල රටේ දියුණුවට දායකවීම සඳහා ශ්‍රී ලංකාවේ ද්විතියික අධ්‍යාපන අවධියේ සිසු සිසුවියන්ට ව්‍යවසායකත්වය හඳුන්වාදීමල මෙම තරගාවලියේ අරමුණ වේ.

## <u>ජයග්‍රාහකයන් තෝරාගැනීම</u>

පාසලේ විදුහල්පතිගේ අනුමැතිය සහිතව ඕනෑම රජයේ පාසලක ව්‍යවසායකත්ව සමාජවලට මෙම තරඟාවලිය සඳහා සහභාගී විය හැකිය. ඒ අනුව පාසල් ව්‍යවසායක සංගමයේ විධායක මණ්ඩලය එක් කණ්ඩායමක් ලෙස මෙම තරගයට සහභාගි විය යුතුය. එම කණ්ඩායම ල ව්‍යවසායකත්ව සමාජයේ සාමාජිකයන් විසින් ඉදිරිපත් කළ නව නිෂ්පාදන අතුරින් තෝරාගත් නව නිෂ්පාදනයක් තරඟය සඳහා ඉදිරිපත් කළයුතුය.

එම නව නිෂ්පාදනය දිස්ත්‍රික් මට්ටමේ ඇගයීම සඳහා ඉදිරිපත් කෙරෙන අතරල □□□ තෝරාගනු ලබන නව නිෂ්පාදනල ජාතික මට්ටමේ ඇගයීම සඳහා ඉදිරිපත් කෙරේ.

ජාතික මට්ටමේදී තෝරා ගනු ලබන හොඳම නව නිෂ්පාදනය ඉදිරිපත් කරන ව්‍යවසායකත්ව සමාජයල <u>"හොඳම පාසල් ව්‍යවසායකත්ව සමාජය" ලෙස තෝරා ගනු ලැබේ.</u>

<u>තරගාවලිය පාසල් මට්ටමේදී පැවැත්වීම අදියර 3ක් යටතේ සිදුවේ.</u>

- **පළමු අදියර**

මෙහි දී පාසල් ව්‍යවසායකත්ව සමාජයේ විධායක මණ්ඩලය විසින් පහත පියවර අනුගමනය කළ යුතුය.

1. ප්‍රදේශයේ සාර්ථක ව්‍යවසායකයකු පාසලට ගෙන්වා ඔහුගේ/ඇයගේ සාර්ථක ව්‍යවසායක අත්දැකීම් සිසුන්ට බෙදා දීම සඳහා එක් දින වැඩමුළුවක් පැවැත්වීම.

2. **පාරිසරික තිරසාරත්වය හා දේශීයත්වය** යන සාධකවලට මුල් තැන දෙමින් නව ව්‍යවසායකත්ව අදහස් මත පදනම් වූ නව නිෂ්පාදනයක් ඉදිරිපත් කරන ලෙස සාමාජිකයන්ට දැනුම්දීම.
3. ඒ අනුව සාමාජිකයන් වෙතින් ඉදිරිපත්වූ නව නිෂ්පාදන එළිදැක්වීම සඳහා ප්‍රදර්ශනයක් පැවැත්වීම.

4. එම නව නිෂ්පාදන ඇගයීමට ලක් කර, ඒ අතුරින් **පාරිසරික තිරසාර බව හා දේශීයත්වය** පිළිබිඹු වන හොඳම නව නිෂ්පාදනය තෝරාගැනීම.

මෙම තෝරා ගැනීමට අදාළ පාසල් මට්ටමේ ඇගයීම - විදුහල්පතිතුමා / ව්‍යවසායකත්ව සමාජය භාර ආචාර්යවරයා සහ විධායක කමිටුව විසින් අපක්ෂපාතව සිදුකළ යුතුය.

- **දෙවන අදියර**

දෙවන අදියරේ දී විධායක මණ්ඩලය විසින් තෝරාගත් නව නිෂ්පාදනය සම්බන්ධ ව්‍යාපාර සැලැස්ම පහත කරුණු ඇතුළත් කරමින් සකස් කළයුතුය.

- නිෂ්පාදනයේ ප්‍රධාන අදහස :
  Main Idea

  යොදාගත් සම්පත් : Resources
  1. මුල්‍ය Financial
  2. .ද්‍රව්‍ය Materials
  3. කම්කරුවන් Labors
  4. ස්ථානය Location

- අලෙවිකරණ සැලැස්ම: Marketing Plan
  1. විකුණුම් සැලැස්ම Sales Plan
  2. බෙදා හැරීමේ සැලැස්ම Distribution Plan
  3. පර්යේෂණ සැලැස්ම Research Plan

- පුළුල් කිරීමේ සැලැස්ම : Expansion Plan
  1. ප්‍රවර්ධන සැලසුම් Promotion Plans
  2. ප්‍රජාව සම්බන්ධ කර ගන්නා ආකාරය
     How engages the community

3. බෙදා හැරීමේ සැලැස්ම Distribution Plan

- නව නිෂ්පාදන සංවර්ධන සැලසුම් New Product Development Plans
  1. සමාන නිෂ්පාදන Similar Products
  2. විවිධ නිෂ්පාදන Different Products

- ශක්‍යතා අධ්‍යයනය : Study Feasibility
  1. මූල්‍ය ශක්‍යතාව Financial Feasibility
  2. වෙළඳපල ශක්‍යතාව Market Feasibility
  3. ධාරිතාව ශක්‍යතාව Capacity Feasibility
  4. අමුද්‍රව්‍ය ශක්‍යතාව Raw materials Feasibility
  5. සම්පත් ශක්‍යතාව Resources Feasibility

- ව්‍යාපාර අඛණ්ඩතා සැලැස්ම
  Business Continuity Plan

➢ **තුන්වන අදියර**

පාසල් මට්ටමෙන් තෝරාගත් නව නිෂ්පාදනය සහ ඊට අදාළ ව්‍යාපාර සැලැස්ම විධායක කමිටුව විසින්, විදුහල්පතිතුමා / ව්‍යවසායකත්ව සමාජය භාර ආචාර්යවරයාගේ නිර්දේශ සහිතව ශ්‍රී ලංකා අලෙවිකරණ ආයතනය වෙත ලබාදීම.

පාසල් මට්ටමින් තෝරා ගනු ලැබූ නව නිෂ්පාදනය හා ඊට අදාළ ව්‍යාපාර සැලැස්ම, ශ්‍රී ලංකා අලෙවිකරණ ආයතනය විසින් පාසල අයත් දිස්ත්‍රික්කය තුළ ඇගයීම සඳහා යොමු කරනු ලැබේ.

## <u>දිස්ත්‍රික් මට්ටමේ ඇගයීම</u>

දිස්ත්‍රික් මට්ටමේ ඇගයීම පහත සාමාජිකයන්ගෙන් සැදුම් ලත් කමිටුවක් මගින් සිදුවේ.

- දිස්ත්‍රික්කය අයත් පළාතේ වාණිජ විෂය භාර අධ්‍යක්ෂ
- වෙනත් දිස්ත්‍රික්කයක කලාප භාර වාණිජ විෂය භාර අධ්‍යක්ෂවරුන් තිදෙනෙක්
- ශ්‍රී ලංකා අලෙවිකරණ ආයතනයේ නිලධාරියෙක්
- ශ්‍රී ලංකා අලෙවිකරණ ආයතනයේ අධ්‍යක්ෂවරයෙක්

දිස්ත්‍රික් මට්ටමේ ඇගයීම් කමිටුව මගින් ඒ ඒ දිස්ත්‍රික්කවලින් තරගයට ඉදිරිපත් වූ පාසල් ව්‍යවසායක සමාජ සඳහා ලකුණු ලබාදෙනු ලැබේ .

<u>මෙම ඇගයීම වට 3 කින් පැවැත්වේ</u>

- පළමු වටයේදී පාසලේ එක්දින වැඩමුළුව, නව නිෂ්පාදන ප්‍රදර්ශනය හා හොඳම නව නිෂ්පාදනය හා එහි ව්‍යාපාර සැලැස්ම සඳහා ලකුණු ලැබේ. එම ලකුණු අනුව සෑම දිස්ත්‍රික්කයකින්ම 4 බැගින් නියෝජනය වන පරිදි හොඳම පාසල් ව්‍යවසායක සමාජ 100 ක් තෝරාගැනීම සිදුකෙරේ.

- දෙවන වටයේදී එම පාසල් ව්‍යවසායක සමාජ 100 හි ව්‍යාපාර සැලැස්මේ අන්තර්ගත නව නිෂ්පාදන සංවර්ධන සැලැස්ම ඇගයීම මගින් ජයග්‍රාහී පාසල් ව්‍යවසායක සමාජ 50 ක් තෝරාගනු ලබයි.

- තෙවන වටයේදී එම පාසල් ව්‍යවසායක සමාජ 50 හි ව්‍යාපාර සැලැස්මේ අන්තර්ගත ව්‍යාපාර අඛණ්ඩතා සැලැස්ම අනුව අවසාන ජයග්‍රාහී පාසල් ව්‍යවසායක සමාජ 25 ක් තෝරාගනු ලැබේ

  එනම්,

දිස්ත්‍රික් මට්ටමේදී

1 වටයේදී හොඳම ව්‍යවසායක සමාජ100 ක්ද (එක් දිස්ත්‍රික්කයකින් පාසල් 4)

2 වටයේදී හොඳම ව්‍යවසායක සමාජ 50 ක්ද

3 වටයේදී හොඳම ව්‍යවසායක සමාජ 25 ක්ද තෝරා ගනු ලබයි.

දිස්ත්‍රික් මට්ටමේදී අවසන් වටයට සුදුසුකම් ලැබූ අවසන් ජයග්‍රාහක ව්‍යවසායක සමාජ 25 අතුරින්, ජාතික මට්ටමේ ජයග්‍රාහකයන් තෝරාගැනීම සිදුවේ.

## **ජාතික මට්ටමේ ජයග්‍රාහකයන් තේරීම**

පහත සාමාජිකයන්ගෙන් සැදුම්ලත් ඇගයීම් කමිටුවක් මගින් මෙම ඇගයීම සිදු කෙරේ.

- අධ්‍යාපන අමාත්‍යංශයේ වාණිජ විෂය අධ්‍යක්ෂ
- අධ්‍යාපන අමාත්‍යංශයේ නියෝජ්‍ය අධ්‍යක්ෂ වරුන් දෙදෙනෙක්
- පළාත් වාණිජ විෂය භාර අධ්‍යක්ෂවරුන් තිදෙනෙක්
- ශ්‍රී ලංකා අලෙවිකරණ ආයතනයේ අධ්‍යක්ෂවරුන් දෙදෙනෙක්

මෙහිදී අවසන් ජයග්‍රාහක ව්‍යවසායක සමාජ 25 විසින් නව නිෂ්පාදනය සහ ඊට අදාල ව්‍යාපාර සැලැස්ම මෙන්ම තම නව නිෂ්පාදනය සම්බන්ධයෙන් කරුණු ඉදිරිපත් කිරීමක්ද (Presentation) සිදු කළ යුතුය.

ජාතික මට්ටමේ ජයග්‍රාහී කණ්ඩායම තේරීමද වට 3ක් ඔස්සේ සිදුවේ.

එනම් ,

ජාතික මට්ටමේදී

1 වටයේදී හොඳම ව්‍යවසායක සමාජ 10 ක්ද,

2 වටයේදී හොඳම ව්‍යවසායක සමාජ 5 ක්ද,

3 වටයේදී හොඳම ව්‍යවසායක සමාජ 2 ක්ද

තෝරා ගැනීමෙන් අනතුරුව, අවසාන මහා තරගාවලියේදී අවසන් ව්‍යවසායක සමාජ 2 අතුරින් හොඳම නව නිෂ්පාදනය ඉදිරිපත් කළ ව්‍යවසායකත්ව සමාජය, "හොඳම පාසල් ව්‍යවසායකත්ව සමාජය" ලෙස තෝරා ගනු ලැබේ.

**SLIM ශිෂ්‍යත්ව, සමරු ඵලක, සහතිකපත් හා ත්‍යාග පිරිනැමීම**

- දිස්ත්‍රික් මට්ටමින් පවත්වන තරඟ වට තුනේදීම තේරී පත්වන පාසල් ව්‍යවසායකත්ව සමාජවල විධායක මණ්ඩල සාමාජිකයන්ට සහතිකපත් පිරිනැමේ. මීට අමතරව ජයග්‍රාහී පාසල්වල විදුහල්පතිවරුන්, ව්‍යවසායකත්ව සමාජය භාර ගුරුභවතුන් සහ අදාළ කලාප / පළාත් වාණිජ විෂය අධ්‍යක්ෂවරුන් දිස්ත්‍රික් මට්ටමින් ඇගයීමට ලක්කෙරේ

- ජාතික මට්ටමින් පවත්වන තරඟ වට තුනේදීම ජයග්‍රහණය කරන පාසල් ව්‍යවසායකත්ව සමාජවල විධායක මණ්ඩල සාමාජිකයන් සඳහා සහතිකපත්, කුසලාන හා ශිෂ්‍යත්ව ප්‍රදානය කෙරේ. මීට අමතරව ජයග්‍රාහී පාසල්වල විදුහල්පතිවරුන්, ව්‍යවසායකත්ව සමාජ භාර ගුරුභවතුන්, පළාත් වාණිජ විෂය අධ්‍යක්ෂකවරුන් ජාතික මට්ටමින් ඇගයීමට ලක්කෙරේ.
- අවසාන වටයේදී ජයග්‍රහණය කරන, වසරේ හොඳම ව්‍යවසායකත්ව සංගම් දෙක සඳහා ශූරතාව හා අනුශූරතාවට අදාළ ත්‍යාග, සහතිකපත්, කුසලාන හා ශිෂ්‍යත්ව පිරිනැමේ.

**අනුග්‍රාහක දායකත්වය**

- මෙම සියළු ත්‍යාග, සහතිකපත්, කුසලාන හා SLIM ශිෂ්‍යත්ව ශ්‍රී ලංකා අලෙවිකරණ ආයතනයේ කාරුණික අනුග්‍රහයෙන් සිදුකෙරේ.

- මෙම තරඟාවලිය ජාතික මට්ටමේ දෙවන වටයේ සිට සජීපනා රූපවාහිනී වැඩසටහනක් ලෙස පවත්වනු ලැබේ. ජාතික මට්ටමින් පවත්වන අවසාන මහා තරඟයෙන් එම වැඩසටහන් පෙළ නිමාවට පත් වනු ඇත.

තරඟය පිළිබඳ වැඩි විස්තර සඳහා අමතන්න:

දුරකථන අංකය: 0701918072 (සසික් රාජපක්ෂ)

විද්‍යුත් තැපැල : sasik.r@slim.lk